# කටපාඩම් පද - 6 ශ්‍රේණිය

## බයිබල් පාඨ

1) සමිදාණෝ දයාවන්තය. අනුකම්පාවෙන් පුර්ණය. වහා නොකිපෙන සුලුය. තිරසර පෙමින් යුතුය. - **ගීතාවලිය** 145:8

2) සමිඳුන් හට තුති පුදන්න. එතුමාණෝ යහපත්ය. එතුමන්ගේ තිරපෙම සදහට පවත්නේය. - **ගීතාවලිය** 136:1

3) ජීවමාන සියල්ලෝ සමිඳුන් පසසත්වා! සමිඳුන්ට ප්‍රශංසා වේවා! - **ගීතාවලිය** 150:6

4) සමිදාණන් අති උතුම් බවත්, වෙනත් සියලු දෙවිවරුන්ට වඩා අපේ සමිදාණන් උසස් බවත් දනිමී. - **ගීතාවලිය** 135:5

5) කන් ඇත. එහෙත් නොඇසෙයි; නාස් පුඩු ඇත, එහෙත් හුස්මක් නැත. - **ගීතාවලිය** 135:17

6) සමිඳුන්ට ප්‍රශංසා කරන්න. එතුමාණෝ යහපත්ය. එතුමාණෝ කරුණාබර වන සේක. එතුමන්ගේ නාමයට ගී ගයන්න.
- **ගීතාවලිය** 135:3

7) මන්ද, සමිදාණෝ තමන් සෙනගට යුක්තිය ඉටුකර දෙන සේක. ස්වකීය මෙහෙකරුවන්ට අනුකම්පා කරන සේක
- **ගීතාවලිය** 135:14

## අපෝස්තුළුවරුන්ගේ විශ්වාස ලක්ෂණය

8) ශුද්ධාත්මානුභාවයෙන් ඔවුන්වහන්සේ ගැබ බැස කන්‍යා මරිය තුමියගෙන් උපන්නා හ - 3 **වගන්තිය**

9) ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ, පෝන්සියුස් පිලාත් යටතේ, කුරුසියෙහි ඇණ ගසනු ලැබ, මරණයේ වේදනා විඳ, උකුත් වී තැන්පත් කරනු ලැබූ සේක - 4 **වගන්තිය**

10) ඔවුන්වහන්සේ පාතාලයට බැස, තුන්වෙනිදා මළවුන් කෙරෙන් උත්ථාන වී වදාළ සේක - 5 **වගන්තිය**